රිදීගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

## 01. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය  කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රිදීගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී මිලට ගත් රු.40,000 ක ජලය පිරිසිදු කිරීම් යන්ත්‍රය ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනයෙන් දී ඇති නිරීක්ෂණ පිළිගන්නා අතර, එය මීළඟ වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබුණු තොග භාණ්ඩ අයිතම 12 ක වටිනාකම වූ රු. 61,995 ක් ගිණුම්ගත කර නොතිබුණි. | තොග ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | රු.61,995 ක වටිනාකමින් යුත් උපකරණ මීළඟ වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත 05 ක් සංවර්ධනය සඳහා වැයකළ රු. 1,761,436 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනයෙන් දී ඇති නිරීක්ෂණ පිළිගන්නා ලද අතර, එය මීළඟ වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.13,323,623 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.21,066,405 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 4,609 | 4,729 | 5,126 | 2,243 | 4,224 | 4,734 | 4,615 | 2,639 |
| කුලී | 9,880 | 6,939 | 6,981 | 286 | 8,030 | 13,445 | 13,670 | 328 |
| බලපත්‍ර ගාස්තු | 1,658 | 1,063 | 1,102 | 8 | 1,933 | 1,207 | 35,956 | 47 |
| වෙනත් ආදායම් | 27,956 | 82,459 | 80,566 | 24,990 | 27,350 | 75,406 | 55,472 | 23,852 |
| එකතුව | 44,103 | 95,190 | 93,775 | 27,527 | 41,537 | 94,792 | 109,713 | 26,866 |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ වරිපනම් කොට්ඨාශ 09 කින් හා උප කාර්යාල 02 කින් අයවිය යුතු රු. 2,004,304 ක වරිපනම් බදු හිඟයක් පැවතුණි. | පනතේ විධිවිධාන හා රීති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය සභා පනතේ හා රීතිවල සඳහන් විධිවිධාන ප්‍රකාරව ආදායම් රැස් කිරීම සඳහා 2019 වර්ෂය තුළ දේපල තහනම් කිරීමේ වැඩසටහන් 07ක් සහ ආදායම් එකතු කිරීමේ ජංගම වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කල බව විගණනය වෙත කාරුණිකව දන්වා සිටිමි. |

## 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයේ ආරම්භක දිනට රු.328,259 ක හිඟ බදු කුලියක් පැවතියද, වර්ෂය තුළ ඉන් රු.44,630 ක් පමණක් අයකරගෙන තිබුණි. | හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා ප්‍රාග්ධන වියදම් රු.312,000 ක් හා පුනරාවර්ථන වියදම් රු.9,723,058 ක් දරා | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් පරිදි සිදුකිරීමට කටයුතු කළ යුතුවේ. | කසළ අවසන් බැහැරලීම සඳහා සභාව සතුව සුදුසු ඉඩමක් නොවන බැවින් මහජන පීඩා හා පරිසර හානි අවම ඒ සඳහා සුදුසු ඉඩමක් ලබා ගැනීම සඳහා රු.156,191 ක |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. කසළ වැළලීම සඳහා බදු ගෙන තිබුණු පෞද්ගලික ඉඩමට නොදිරන කසළ ටොන් 65.2 ක් පමණ බැහැර කර තිබුණි. | | මුදලක් වැය දරා ඇති බවත් කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) | දිරන කසල ටොන් 214.9 ක් භාවිතා කර කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 30,925 ක් නිෂ්පාදනය කර තිබුණි. එයින් වර්ෂය තුළ අලෙවිකර තිබුණු කාබනික පොහොර ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 2,105 ක් විය. | වර්ෂය තුළ නිෂ්පාදන ඇසුරුම් කර අලෙවිය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණනයෙන් පෙන්වා දී ඇත්තේ වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලද හලා ඇසුරුම් නොකළ තොගයක් වන අතර ඉන් ඇසුරුම් කරන ලද පොහොර කි.ග්‍රෑ 2105ක් අලෙවි කර ඇත. අලෙවි කටයුතු වර්ධනය කර ගැනීම සඳහා බලප්‍රදේශයේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන දැනුවත් කරමින් පවතී. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 16 දිනැති අංක 2098 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව 2019 වර්ෂයට සංගීත සංදර්ශන හා සැණකෙළි සඳහා සහා ක්‍රීඩාංගනය ලබාදීමේදී නියමිත ගාස්තු අයකළ යුතු වුවද, 2019 මාර්තු මාසයේ දින 05 ක පැවති රිදී මේලා සංගීත සැණකෙළිය වෙනුවෙන් දොඩම්ගස්ලන්ද මහජන ක්‍රීඩාංගනය රු. 61,426 ක ගාස්තුව අයනොකර ලබා දීමට කටයුතු කර තිබුණි. | මුදල් අයකර සිදුකරන කටයුතු වෙනුවෙන් ක්‍රීඩාංගනය ලබාදීමේ දී ගැසට් පත්‍රය ප්‍රකාරව ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 මාර්තු 27,28,29,30 හා 31 යන දිනයන්හි පවත්වනු ලැබූ රිදී මේලා සංගීත සැණකෙළිය වෙනුවෙන් දොඩම්ගස්ලන්ද මහජන ක්‍රීඩාංගනය නොමිලේ ලබාදීමට හේතු වූයේ එම සැණකෙළිය සංවිධානය කරනු ලැබූ දොඩම්ගස්ලන්ද ශක්ති ත්‍රීරෝද රථ සංගමය මඟින් මහජනතාවගේ සමාජයීය සංවර්ධනය සහ අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා සමාජ සත්කාර රැසක් ඉටු කරනු ලැබූ බැවිනි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වසරක් හෝ ඊට වැඩි කාලයක් ඉක්මවා තිබෙන රු. 3,934,130 ක් වූ ශේෂ පැවතුණි. 2020 මැයි 30 වන විට එයින් රු. 3,543,241 ක් තවදුරටත් අයවීමට තිබුණි. | තවදුරටත් ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් රැස්කරගැනීමේ ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කර අදාළ හිඟ ආදායම් රැස් කරගැනීමටත් බදු කුලී ආදායම් රැස් කර ගැනීම සඳහා නඩු 03 ක් අධිකරණයේ විභාග වෙමින් පවතින බවත් විගණනය වෙත කාරුණිකව වාර්තා කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වසරක් හෝ ඊට වැඩි කාලයකට අදාළ රු.14,167,033 ක් පැවතුණි. 2020 මැයි 30 වන විට 2019 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයෙන් තවදුරටත් රු.27,010,654 ක් නිරවුල් කිරීමට පැවතුණි. | තවදුරටත් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020.05.30 දින වන විට රු.27,010,654 ක් දක්වා අඩු වී ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්යය මණ්ඩලයේ ද්විතියීක හා ප්‍රාථමික අංශයේ පුරප්පාඩු 16 ක් ද්විතියීක අංශයේ අතිරික්තතා 03 ක් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් 05 දෙනෙකු විය. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අතිරික්තතා විධිමත් කරගැනීමට කටයුතු කළ යුතුවේ. | අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 07ක් වන අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 20 කි. එම අනුයුක්ත පිරිසද තත්‍ය කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීම මත සේවක සංඛ්‍යාව 108 ක් වී ඇත. එසේම කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් 05 දෙනාද සමඟ සේවක සංඛ්‍යාව 113 ක් ලෙස සඳහන් කර ඇත. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාව විසින් ගිණුම්ගත කර භුක්ති විඳිනු ලබන නමුත් පවරා නොගත් රු.12,420,000 ක් වටිනා වත්කම් 11 ක් විය. | භුක්ති විඳින වත්කම් නිරවුල් කර සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඉඩම් සමීක්ෂණ කටයුතු පවත්වා එම ඉඩම්වලට ඔප්පු ලබාගැනීමට අදාළ කටයුතු සිදුකරන බව විගණනය වෙත කාරුණිකව දන්වා සිටිමි. |

**3.5** **හදුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සභාව සතු පුස්තකාල 03 හි අස්ථානගතවී තිබුණු රු.50,724 ක් වූ පොත් 398 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | හේවාවිස්ස, රම්බඩගල්ල හා දොඩම්ගස්ලන්ද යන මහජන පුස්තකාලවල 2019.12.31 දිනට සිදු කළ භාණ්ඩ සමීක්ෂණයට අනුව අස්ථානගතව ඇති පොත් 398 ක් සඳහා අදාළ වටිනාකම අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. |